15.08

260

Learning Resource Center
R
De Mazenod College
Kandana

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2024

## කතෝලික ධර්මය

2024.08

| විභාග අංකය:...................................................... | | |
|---|---|---|
| 9 ශ්‍රේණිය | I හා II පත්‍රය | කාලය පැය 02 |

### I කොටස

සැලකිය යුතුයි:

(i) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 1 සිට 20 තෙක් ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. පුරාණ ගිවිසුමේ ප්‍රඥා සාහිත්‍යට අයත් පොත් දෙකකි,

i. උත්පත්ති, ප්‍රේම ගී    ii. ජෝෂුවා, ජෝබ්

iii. ජෝබ්, ගීතාවලිය    iv. ජෝෂුවා, ගීතාවලිය

2. ඉතිහාස පොත් කාණ්ඩයට අයත් පොත් ගණන කීයද?

i. 5 කි.    ii. 7 කි.    iii. 16 කි.    iv. 17 කි.

3. ගීතාවලියෙහි 'සියොන්' යනුවෙන් හැඳින්වෙන්නේ,

i ගලීලය යි.    ii. ජෙරුසලෙම යි.

iii පලස්තීනය යි.    iv. රෝමය යි.

4. මාක් ශුභාරංචිය සඳහා භාවිත වන වෙනත් නමකි,

i දේව රාජ්‍යයේ ශුභාරංචිය.    ii දුක් ප්‍රාප්තියේ ශුභාරංචිය.

iii ශුද්ධාත්මයාණන්ගේ ශුභාරංචිය.    iv අධ්‍යාත්මික ශුභාරංචිය.

5. ජොහන් ශුභාරංචිය ලියවුණු කාලවකවානුව වන්නේ,

i ක්‍රි.ව. 90 – 100    ii ක්‍රි.ව. 80 - 85

iii ක්‍රි.ව. 80 – 90    iv ක්‍රි.ව. 64 – 66

6. A - සාප ලද්දෙක් වීම.    B - වගා කරන විට පලදාව නොදීම.

ඉහත සඳහන් පාපයේ ප්‍රතිඵලයට හිමිකරු වූයේ කවුද?

i. ඒව    ii. ආදම්    iii. කායින්    iv. ආබෙල්

7. දෙවියන් වහන්සේ, ආදම් සහ ඒවට හම් වස්ත්‍ර සාදා දීමෙන් පෙන්නුම් කරන්නේ,

i. පාපයේ බරපතල කමයි.

ii. ඔවුන්ගේ මනස්ථාපනය වීමයි.

iii. මැවිල්ලේ උතුම්කමයි.

iv. පව්වූ මිනිසාට දේව ආදරය හා රැකවරණය ලැබීමයි.

8. උත්පත්ති 6:11-12 ට අනුව ජල ගැල්මට හේතුව වූයේ කුමක් ද?

i මිනිසාගේ දුෂ්ටකම    ii මිනිසාගේ යහපත්කම

iii මිනිසා විනාශ කිරීම    iv මැවිල්ල ප්‍රතිනිර්මාණය කිරීම

9. විර නායකයින් පත් කර ගැනීම පිළිබඳව සඳහන් වන ග්‍රන්ථය කුමක් ද?

i 1 රාජාවලිය | ii ජෝෂුවා
iii ගීතාවලිය | iv විරාවලිය

10. බාරාක් හා කානානීය හමුදාව අතර සටන ඇතිවූයේ,

i සීනයි කන්ද මතයි. | ii තාබෝර් කන්ද මතයි.
iii කාර්මෙල් කන්ද මතයි. | iv කල්වාරි කන්ද මතයි

11. ඉශ්රායෙල් දේශයේ ප්‍රථම රජවරුන් තිදෙනා පිළිවෙලින් සඳහන් පිළිතුර වන්නේ,

i සාවුල්, සාමුවෙල්, දාවිත් | ii සාවුල්, සලමොන්, දාවිත්
iii සාවුල්, දාවිත්, සාමුවෙල් | iv සාවුල්, දාවිත්, සලමොන්

12. ස්වාමින් වහන්සේට ඉතා අලංකාර දේව මාලිගාවක් ජෙරුසලෙම් නුවර ඉදිකරන ලද්දේ කවුරුන් විසින් ද?

i සලමොන් රජතුමා විසින් | ii දාවිත් රජතුමා විසින්
iii නාතාන් විසින් | iv මෝසෙස් විසින්

13. උඩඟුව නැති කරගන්නට දියුණු කර ගත යුතු ධර්ම ගුණය කුමක් ද?

i ශාන්තිය | ii ත්‍යාගීවන්තකම
iii ප්‍රේමය | iv බැහැපත්කම

14. ශුද්ධාත්මයාණන් වහන්සේට විරුද්ධව කරන පාපයකි,

i අනුන්ගේ යහපත ගැන දුක් වීම. | ii දුගීන්ට හිංසා කිරීම.
iii අශුද්ධ දේ කෙරෙහි ඇති ඇල්ම. | iii පාපයෙහි ඇලී ගැලී සිටීම

15. පාපී මගට වැටී දේව ආදරයෙන් ඈත්වී, පීඩා විඳින්නට ඉඩ නොතබා අප සොයා එන ආදරණීය පියකු අපට සිටින බව සඳහන් වන උපමාවක් වන්නේ කුමක් ද?

i. නැති වුණු කාසිය පිළිබඳ උපමාව
ii. යහපත් සමරිතානුවරයා පිළිබඳ උපමාව
iii. මුතු ඇටය පිළිබඳ උපමාව
iv. වපුරන්නා පිළිබඳ උපමාව

16. ශුද්ධ වූ අගොස්තීනු තුමාගේ මවගේ නම වූයේ,

i ඇග්නස් තුමිය ය. | ii රීටා තුමිය ය.
iii මොනිකා තුමිය ය. | iv වෙරෝනිකා තුමිය ය.

17. සදාකාලික දණ්ඩනයෙන් නිදහස් වීමට අපට උදව් වන දේව ප්‍රසාද නිධානය කුමක් ද?

i ප්‍රසාද ස්නාපනය | ii රෝගීන්ගේ ආලේපය
iii පාපොච්චාරණය | iv දිව්‍ය සත්ප්‍රසාදය

18. අපෝස්තුලුවරුන්ගේ ඉගැන්වීම් අනුව රෝගීන් ආලේප කරනු ලබන්නේ කවුරුන් විසින් ද?

i සහෝදරතුමන්ලා විසින් | iii තේවාචාර්යතුමන්ලා විසින්
ii රදගුරුතුමන්ලා විසින් | iv පූජාප්‍රසාදීන් වහන්සේලා විසින්

19. "ස්වර්ගීය නිවහනට සූදානම් කිරීමේ දේව ප්‍රසාද නිධාන" ලෙස හඳුන්වන්නේ කුමන ප්‍රසාද නිධානද?

i. ප්‍රසාද ස්නාපනය, අභිවෘද්ධි ආලේපය හා දිව්‍ය සත්ප්‍රසාදය

ii. ප්‍රසාද ස්නාපනය, පාපොච්චාරණය හා රෝගීන්ගේ ආලේපය

iii. අභිවෘද්ධි ආලේපය, පාපොච්චාරණය හා මාර්ගෝපාකාර දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ

iv. පාපොච්චාරණය, රෝගීන්ගේ ආලේපය හා මාර්ගෝපාකාර දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ

20. "ගබ්සාව ළදරු ඝාතනයකි. අශික්ෂිත අපරාධයකි." මෙලෙස සඳහන් වන්නේ,

i කතෝලික සභා ධර්මෝපදේශයෙහි ය. ii මතෙව් ශුභාරංචියෙහි ය.

iii ගීතාවලියෙහි ය. iv උත්පත්ති පොතෙහි ය.

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර් ය වේ.
- **පළමු ප්‍රශ්නයය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05 කි.**

01.

i. පුරාණ ගිවිසුමට අයත් දිවැසිවර ග්‍රන්ථ 2 ක් නම් කරන්න.

ii. අපොස්තුලුවරුන්ගේ ක්‍රියා පොතෙහි සඳහන් ප්‍රධාන චරිත 2 ක් නම් කරන්න.

iii. ගීතාවලිය හඳුන්වන වෙනත් නම් 2 ක් ලියන්න.

iv. ප්‍රශංසා ගීතිකාවල සඳහන් දෙවියන් වහන්සේගේ ගුණාංග 2 ක් ලියන්න.

v. මතෙව් ශුභාරංචිය සඳහා භාවිත වන වෙනත් නම් 2 ක් ලියන්න.

vi. ජොහන් ශුභාරංචියේ අරමුණ ලියන්න.

vii. දෙවියන් වහන්සේ ඒවට දුන් දඬුවම් 2 ක් ලියන්න.

viii. කායින් හා ආබෙල්ගේ රැකියාවන් වෙන වෙනම ලියන්න.

ix. ශුද්ධ බයිබලයෙහි සඳහන් වීර නායකයින් 2 ක් නම් කරන්න.

x. ජාකොබ් තුමාගේ ලිපියෙහි සඳහන් පරිදි රෝගියෙකු සඳහා කළ යුතු කාර්යයන් 2 ක් ලියන්න.

02.

i. වර්තමානයෙහි ගීතාවලියේ ගීතිකා අප ජනවන්දනාවේදී භාවිත කරන අවස්ථා 2 ක් ලියන්න.

ii. සමදර්ශක ශුභාරංචි නම් කරන්න.

iii. අන් අයගේ යහපත වෙනුවෙන් ඔබට කළ හැකි කාර්යයන් 5 ක් ලියන්න.

03.

i. වීර නායකයන්ගේ මූලික කාර්යයන් 2 ක් ලියන්න.

ii. සාමුවෙල් නම් විනිශ්චයකාරයා පිළිබඳව කරුණු 3 ක් ලියන්න.

iii. පාසල තුළ කිතුනු නායකයෙක් ලෙස ඔබ කරන කාර්යයන් 5 ක් ලියන්න.

04.

i. කර්ම පාපය යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

ii. බරපතළ හෙවත් මරණීය පාපයෙන් ලබන විපාක 3 ක් ලියන්න.

iii. පාප අවස්ථා ජය ගැනීමට ඔබට ක්‍රියා කළ හැකි ආකාර 5 ක් ලියන්න.

05.

i. ශුද්ධ වූ අගොස්තීනු තුමන්ගේ ජීවිත වෙනසක් ඇති වීමට බලපෑ සිදුවීම් 2 ලියන්න.

ii. ස්වර්ගයට මොරගසන පාපයන් 3 ක් ලියන්න.

iii. නොමඟට යන මිතුරෙකු යහමඟට ගැනීමට ඔබට කළ හැකි දේවල් 5 ක් ලියන්න.

06.

i. රෝගීන්ගේ ආලේපය දේව ප්‍රසාද නිධානය ලැබිය හැකි අය කාණ්ඩ 2 ක් ලියන්න.

ii. රෝගීන්ගේ ආලේපය දේව ප්‍රසාද නිධානය මගින් ලැබෙන වරප්‍රසාද 3 ක් ලියන්න.

iii. රෝගී වූ අයෙකු වෙනුවෙන් කිවහැකි යැදුමක් ලියන්න.

07. පහත මාතෘකා අතරින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i. ජොහන් ශුභාරංචිය

ii. දාවිත් රජතුමා

iii. රෝගීන් ආලේප කිරීමේ පිළිවෙත

iv. ජීවිත සුරකිමු



REGISTRAR
De Mazenod College
Kandana.